# 10 වන පාඩම සම්පූර්ණයෙන්ම



## 10.1 සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය.

අදහස් ප්‍රකාශ කිරිම දියුණු මානව අවශ්‍යතාවයකි. අදහස් ප්‍රකාශ කිරිම සඳහා මානවයා ගත් උත්සාහයන් පිළිබඳව ඉතිහාසය මානවයාගේ ඉතිහාසය තරම් පැරැණිය. මානව සන්නිවේදන ක්‍රියාවලියේ ප්‍රථමික සාක්ෂිය ලෙස අප හඳුනා ගන්නා පුරාණ ගල්ලෙන් චිත්‍ර අදහස් ප්‍රකාශ කිරිම සඳහා මානවයා තුළ තිබු ඉතා පැරණි සාක්ෂියකි. අපේ පැරණි ජනකවි, ජනකතා වැනි සාහිත්‍යාංග විමසන විටද පෙනෙන්නේ ඒවා අතීත සමාජය තුළ විසු මිනිසුන්ගේ හැගිම්, ආවේගයන්, විරෝධයන් හා භාවයන් ප්‍රකාශ කිරිම සඳහා යොදා ගත් බවයි. එසේම මෙතෙක් ලෝකය තුළ බිහිවි ඇති භාෂාව, සංගිතය, චිත්‍ර කලාව හා සාහිත්‍ය ඇතුලු සියලු කලාවන්ගේ ප්‍රභවයට හා වර්ධනයට නිදහසේ අදහස් ප්‍රකාශනය ඉවහල් වි ඇත.

එහෙත් සමාජය සංකිර්ණවත්ම අදහස් ප්‍රකාශ කිරිමට ඇති ඉඩකඩ පිළිබඳව යම් යම් සිමාවන් ඇතිවෙයි. ප්‍රකාශන නිදහස සහ ප්‍රකාශන හිමිකම වැනි සංකල්ප බිහිවන්නේ මෙම තත්ත්වය යටතේය.

ප්‍රකාශනයේ නිදහස සහ ප්‍රකාශන හිමිකම එකවර වර්ධනය වූ තත්ත්වයක් නොවේ. සමාජයේ පරිනාමයත් සමගම දිගුකාලින ඉතිහාසයක් පුරා වර්ධනය වුවකි.

නූතනය වන විට අදහස් ප්‍රකාශ කිරිමේ අයිතිය මූලික මිනිස් අයිතිවාසිකමක් ලෙස පිළිගණු ලැබේ. එහෙත් එම නිදහස භාවිතා කිරිම සඳහා ද යම් යම් නිතිමය සිමාවන් පනවා තිබේ. එම නිතිමය සිමාවන් පදනම් කරගෙන අදහස් ප්‍රකාශ කිරිමේ ක්‍රියාවලිය හසුරුවනු ලැබේ.

රටක, සමාජයක ජිවත්වන පුද්ගලයන්ට අනෙකුත් පර්ශ්ව වලට හානියක් හෝ අගතියක් නොවන ආකාරයට සිය අදහස්, අභිමතය ප්‍රකාශ කිරිම සඳහා විවිධ අණපනත්, ධර්මතා, උපදෙස් මාලාවන්, නිති රෙගුලාසි හඳුන්වා දි තිබේ. මේවා සන්නිවේදන ප්‍රතිපත්ති වශයෙන් හඳුන්වා දිමට හැකිය.

මේවා සමාජයෙන් සමාජයට, රටින් රටට, සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් විය හැකිය.

<u>සන්නිවේදන ප්‍රතිපත්ති හැදැරිමේ මූලික අරමුණු.</u>

- සන්නිවේදන ප්‍රතිපත්තිවල අන්තර්ගතය පිළිබඳව අවබෝධය ලබා ගැනීම.
- මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරිත්වය පිළිබඳව අවබෝධය ලබා ගැනිම.
- තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය පිළිබඳ අවබෝධය ලබා ගැනිම.
- මාධ්‍ය සම්බන්ධතා, අධිකාරින් හා බැදි සම්බන්ධතා පිළිබඳ අවබෝධය ලබා ගැනිම.



Udaya Amaraweera, University visiting lecturer.
BA, University of J'Pura, MA & M.Phil in Mass.Com,
University of Kelaniya.
Voice : 0711715342

සන්නිවේදන ප්‍රතිපත්ති සකස් කිරිමේ දි මුලිකවම සලකා බැලිය යුත්තේ රටක සමාජ ධර්මතා විකෘති නොවන ආකාරයට සන්නිවේදන ප්‍රතිපත්ති සකස් කිරිමයි. එමෙන්ම සන්නිවේදන ප්‍රතිපත්ති සකස් කිරිමේ දි පවත්නා සම්මත සිරිත් විරිත් හර පද්ධතින්ට අනුකුලව සකස් කිරිම වැදගත් වේ.

මෙහිදි විවිධ රටවල් විසින් හදුන්වා දි ඇති සන්නිවේදන ප්‍රතිපත්ති පිළිබඳව අවධානය යොමු කිරිම වැදගත් වේ.

1927 දි බී.බී.සී ආයතනය පිළිබඳ බ්‍රිතාන්‍ය රාජකිය ප්‍රඥප්තිය( Royal Charter) විසින් මහා බ්‍රිතාන්‍යය සහ යටත්විජිතවල ගුවන්විදුලි මාධ්‍ය හැසිරවිම පිළිබඳ ප්‍රතිපත්ති හදුන්වා දි තිබේ.

මෙහි පදනම වුයේ මහජන සේවා (Public Service) ගුවන්විදුලි සංකල්පය ස්ථාපිත කිරිමයි. පසුකාලිනව මෙම ප්‍රතිපත්ති රූපවාහිනිය කෙරෙහිද ආදේශ කරනු ලැබිය.

1934 ඇමෙරිකා එක්සත් ජනපදයේ සම්මත කරන ලද සන්නිවේදන පනත ( Communication ACT) මගින් ඇමෙරිකාවේ ගුවන්විදුලිය, රූපවාහිනිය විදුලි සන්දේශ හා විදේශ සන්නිවේදනය සඳහා පෙඩරල් සන්නිවේදන කොමිෂන් සභාව ( Federal Communications Commission – FCC ) පිහිටවනු ලැබිය. එය මාධ්‍ය ආයතන අතර තාක්ෂණික ගැටලු නියාමනය කිරිම සඳහා කටයුතු කර තිබේ.

සන්නිවේදන ප්‍රතිපත්ති සැලසුම් කිරිම සඳහා කිරිම පවත්වන ලද ප්‍රථම සම්මන්ත්‍රණය 1976 කොස්තාරිකාවේ සැන්ජෝස්හිදි පවත්වනු ලැබිය. නව ජාතික හා ජාත්‍යන්තර සන්නිවේදන මණ්ඩලයක් පිහිටුවා ගැනිම කෙරෙහි එහිදි අවධානය යොමු විය. සෑම රටකම ජාතික විඥානයට අමතරව අන්ර්ජාතික සම්බන්ධතා තහවුරු කරන ආකාරයෙන් සන්නිවේදන ප්‍රතිපත්ති සකස් කර ගත යුතු බව පෙන්වා දෙන ලදි. එතැන් පටන් රටවල් තම සන්නිවේදන ප්‍රතිපත්ති මාලාව විධිමත් කිරීමේ කාර්යය ආරම්භ කරන ලදී.

1970 දශකය අගභාගයේ දි නොබෙල් සමා ත්‍යාගලාභී ශොන් මැක්බ්‍රයිඩ්ගේ (Sean Mcbrid) සහභාගිත්වයෙන් යුනෙස්කෝ සංවිධානය විසින් ගෝලිය මාධ්‍ය නිරූපණය වඩාත් සාධාරණීකරණය කිරිමට මැක්බ්‍රයිඩ් කොමසම ආරම්භ කරන ලදී.

ගෝලිය සන්නිවේදන අසමතුලිතතා සම්බන්ධ මුලික ගැටලු පිළිබඳව එවකට සිටි සන්නිවේදන විශාරදයන්ගේ අවධානයට යොමු විය. 1964 දි විල්බර් ශ්‍රාම් ජාතින් අතර ප්‍රවෘත්ති ගලනය පිළිබඳව අදහස් දක්වමින් සංවර්ධනය වෙමින් පවතින ප්‍රවෘත්ති අඩු අවධානයක් හා යථාර්ථය විකෘති කිරිමක් කරන බව ප්‍රකාශ කර තිබේ.

1969 දි හර්බට් ශෙලර් ( Herbert Schiller) ගුවන්විදුලි සංඛ්‍යාත වෙනස් කිරිම සම්බන්ධයෙන් අධ්‍යයනය කොට ඒවා චන්ද්‍රිකා සම්බන්ධතා මත යුද්ධමය අවශ්‍යතා සඳහා වැඩි වශයෙන් යොදවන බව පෙන්වා දුනි.



**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

මෙම අදහස් 1970 දශකයේ දි නොබැදි ජාතින්ගේ සමුළුව හා යුනෙස්කෝ සංවිධානයේ සාකච්ඡාවට භාජනය විය. මෙය නොබැදි රටවල් අතර ප්‍රවෘත්ති හුවමාරු ක්‍රමවේද ගොඩනැගීමට ද හේතුවිය.

යුනෙස්කෝ සංවිධානය විසින් නිකුත් කරනු ලැබූ " Many Voices One World" නම් මැක්බ්‍රයිඞ් වාර්තාව වැදගත් වේ. එහි දක්වන ආකාරයට රටක සන්නිවේදන ප්‍රතිපත්ති සකස් විය යුත්තේ අසමානතා දුරුකිරිමට බවයි. මෙහිදි එම රටේ සුළුතර ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරිමට ඇති අයිතිය සුරක්ෂිත කළ යුතුය.

යුනෙස්කෝ සංවිධානය පෙන්වා දෙන්නේ ඕනෑම පුද්ගලයකුට යහපත් ජීවිතයක් ගත කිරිමට අයිතියක් ඇති බවයි. ඒ සඳහා ජාතික හා අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සන්නිවේදන ප්‍රතිපත්ති මාලාවක් සකස් කළ යුතුය. එයින් සමාජ දුරස්ථභාවය අවම කරයි. සාමය සහ සමානාත්මතාව ඇති කරනු ලබයි. සෑම පුද්ගලයකුගේම ආත්ම ශක්තිය සලසාලන සන්නිවේදන ප්‍රතිපත්ති මාලාවක් සකස් කළ යුතුය. පුද්ගල ජිවිතයේ සෑම අංශුවක් හා සමගම සන්නිවේදනය බැදි පවතින බැවින් සන්නිවේදන පරතරය අවම කිරිම හෝ තුරන්කිරිම සඳහා සන්නිවේදන ප්‍රතිපත්ති සකස් කිරිම වැදගත් වේ.

<u>මාධ්‍ය ප්‍රතිපත්තිය</u>

රටක පවතින ජනමාධ්‍ය ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව මාධ්‍ය ප්‍රතිපත්ති මගින් පෙන්වා දෙයි. විශේෂයෙන්ම රටක පවත්නා සමාජ ආචාර ධර්ම හර පද්ධති සංස්කෘතිකාංග හා පුද්ගල නිදහස ආරක්ෂාව වන පරිදි එරටේ ජනමාධ්‍ය ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව විවිධ අණපනත් නිතිරෙගුලාසි ප්‍රකාශන ආචාරධර්ම හඳුන්වා දි තිබේ. මේවා මාධ්‍ය ප්‍රතිපත්ති වශයෙන් හැදින්විය හැකිය.

රටක මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරිමේ දි සන්නිවේදන ප්‍රතිපත්ති සැලැකිල්ලට ගනු ලබයි. මාධ්‍ය ප්‍රතිපත්ති කිසියම් රටක පොදු මහජනතාවගේ ශුභසිද්ධිය සඳහා සම්පාදනය කරයි. මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරිමේ දි එරටේ පවත්නා පාලන රාමුව පිළිබඳව අවධානය යොමු කිරිම වැදගත් වේ. ප්‍රජාතන්ත්‍රවාදි පාලන රාමුවක් ඇති රටවල මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරිමේ දි එය ජනතා හිතවාදි ස්වරූපයක් ගනියි. ඒකාධිපතිවාදි පාලන ක්‍රමයක් ඇති රටක මාධ්‍ය ප්‍රතිපත්තිය තොරතුරු දැනගැනිමේ අයිතිය සිමා වන පරිදි සම්පාදනය කරයි.

රටක මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරිමේ දි මාධ්‍ය හෝ සන්නිවේදන හිමිකම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රකාශන අණපනත් ආචාරධර්ම ඉවහල් කර ගනු ලබයි. උදා: මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

<u>මාධ්‍ය ප්‍රතිපත්තියක අන්තර්ගත කරුණු</u>

- මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරිත්වය.
- තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය.
- මහජනතාව සමග මාධ්‍ය සම්බන්ධතාව.
- මාධ්‍ය අධිකාරින් හා වෙළඳ පොළ නියාමනය.

<u>රටකට මාධ්‍ය ප්‍රතිපත්තියක් තිබීමේ වැදගත්කම.</u>

- නිරවද්‍යතාව අපක්ෂපාතිත්වය සහ සාධාරණත්වය පිළිබඳ මූලධර්ම වලට ගරු කිරිම සඳහා.
- ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අවබෝධය සහ මානුෂීය ප්‍රජා අතර සම්බන්ධතාව ප්‍රවර්ධනය කිරිම සඳහා.
- ප්‍රකාශ කිරිමේ නිදහස සහතික කිරිම මගින් විවිධ සංස්කෘතික හා ප්‍රජා අතර සමගිය ප්‍රවර්ධනය කිරිම සඳහා.
- සියලුම මාධ්‍ය ආයතන වල කාර්යභාර්ය ස්වාධීන කිරිම මගින් ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරිම සඳහා .
- ආචාර ධර්ම හා සදාචාරාත්මක මාධ්‍යවේදී පිළිවෙත් ප්‍රවර්ධනය කිරිම සහ ස්වාධීන යාන්ත්‍රණය නිර්මාණය කිරිමෙන් මාධ්‍ය ක්ෂේත්‍රයේ විනිවිධ භාවය ප්‍රවර්ධනය කිරිම සඳහා .

සන්නිවේදන ප්‍රතිපත්ති පිළිබඳව සාකච්ඡා කිරිමේ දි අදහස් ප්‍රකාශ කිරිමේ නිදහස සම්බන්ධයෙන් ඇති ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

<u>මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය.</u>

**මානව හිමකම් පිළිබඳව විශ්ව ප්‍රකාශනය 1948 දෙසම්බර් 10 දින පැරිසියේ පවත්වන ලද එක්සත් ජාතින්ගේ මහාමණ්ඩලය විසින් පිළිගෙන ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව සෑම වසරකම දෙසම්බර් 10 දින විශ්ව මානව හිමිකම් දිනය ලෙස නම් කර තිබේ.**

**මෙම ප්‍රකාශනයට නීතිමය බලයක් නැතත් එහි සදාචාරාත්මක වටිනාකමක් තිබේ. මෙම ප්‍රකාශනය මගින් පිළිගැනෙන්නේ අදහස් දැරීමේ හා පළ කිරීමේ නිදහස සමස්ත මානව වර්ගයාටම ආවේනික අයිතියක් බවයි. එමෙන්ම මෙයට ජීවත්වීමේ අයිතිය, නිදහස් භාෂණය, පෞද්ගලිකත්වය වැනි දේ අඩංගු වේ.**

**සන්නිවේදනය සම්බන්ධයෙන් මෙහි 19 වන වගන්තිය වැදගත් වේ. එහි මෙසේ දැක්වේ.**

**19 වගන්තිය - තම මතය දැරීමේ හා ප්‍රකාශ කිරීමේ නිදහසට අයිතියක් සෑම කෙනෙකුටම ඇත. බාධා කිරීම් වලින් තොරව මතිමතාන්තර දැරීමේත්, සීමා මායිම් නොසලකා කවර හෝ මාධ්‍යයක් මගින් තොරතුරු හා අදහස් සෙවීමේ, ලබා ගැනීමේ හා බෙදා හැරීමේ නිදහස ඇතුලත්ය.**

**1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් අපේ රටට ද මෙය පිළිගෙන තිබේ.**

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ( ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව)</u>

**1978 දි මෙරට පාලකයන්ට ශක්තිමත් විධායකයක් පිහුටුවීම පරමාර්ථ කොටගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978) දී හඳුන්වා දෙනු ලැබීය. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරිච්ඡේද 24ක් හා වගන්ති 172 දක්නට ලැබේ.**

**1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජ ව්‍යවස්ථාව අනුව එහි III වන පරිච්ඡේදයේ 10 වැනි වගන්තියේ සිට 14 වගන්තිය දක්වා මූලික අයිතිවාසිකම් අන්තර්ගත වේ.**

**14(1) ( අ) වගන්තිය**

**“ සෑම පුරවැසියෙකුටම භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුලු අදහස් පළ කිරීමේ නිදහසට හිමිකම් ඇත්තේය”.**

**එමෙන්ම මෙම ව්‍යවස්ථාව මගින් ඉහත ආකාරයට අදහස් පළ කිරීමට ලබා දී ඇති නිදහසට සීමාවන් පනවා තිබේ. එම සීමාවන් පනවා තිබෙන්නේ 15(1) සහ 15(2) වගන්ති වලිනි.**

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J’Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

15(1) 13 වන ව්‍යවස්ථාවේ (5) වන සහ (6) වන අනු ව්‍යවස්ථා වලින් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද ක්‍රියාත්මක කළ හැක්කේ ද රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට පමණක් යටත්වය. මෙම අනු ව්‍යවස්ථාවේ කාර්ය සඳහා නීතිය යන්නට මහජන ආරක්ෂාව පිළිබඳ තත් කාලයේ අදාල වන නීතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුළත් වන්නේය.

15 (7) 12 වන ව්‍යවස්ථාවෙන්, 13 වන ව්‍යවස්ථාවේ (1) වන හා (2) වන අනුව්‍යවස්ථා වලින් 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති සියලුම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද ක්‍රියාත්මක විය හැක්කේ ද රාජ්‍ය ආරක්ෂාව ද රටේ යථා පැවැත්ම ද තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත්, අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට සහ ඊට නිසි පරිදි ගරු කරන බවට වගබලා ගැනීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු ශුභ සාධනය සඳහා යුක්තිසහගත ව අවශ්‍ය දෑ සපුරා ලීම පිණිසත් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්ව ය. මේ අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා "නීතිය" යන්නට මහජන ආරක්ෂාව පිළිබඳ ව තත්කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුළත් වන්නේ ය.

19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් තොරතුරු අයිතිය ද මූලික අයිතිවාසිකමක් ලෙස තහවුරු කර ඇත.

<u>2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත.</u>

යම් කිසි පුද්ගලයකු විසින් බිහිකරනු ලබන නිර්මාණාත්මක අංගයක් බුද්ධිමය දේපළක් වශයෙන් හඳුන්වනු ලැබේ. නිදසුනක් ලෙස නිර්මාණකරුවෙකු විසින් බිහි කරනු ලබන නව චිත්‍රපටයක්, නව කථාවක්, පරිගණක වැඩසටහනක්, ගීතයක්, මූර්තියක් බුද්ධිමය දේපලක් වශයෙන් හැඳින්විය හැකිය.

මෙසේ නව නිර්මාණයක් බිහි කළ පසුව එම නිර්මාණ ශිල්පියාට ඇති ගැටලුව නම් ඒවායේ ව්‍යාජ පිටපත් නිර්මාණය කිරීම, සොරකම් කිරීම, ප්‍රති නිශ්පාදනය කිරීමයි. මෙම පනත මගින් සිදු කරන්නේ නිර්මාණයක සැබෑ හිමිකරුට එහි අයිතිය ආරක්ෂා කර දීමයි.

බුද්ධිමය දේපළ යන්න විද්‍යාත්මකව පහත ලෙස හැඳින්විය හැකිය. " මානව මතයේ නිර්මාණශීලීත්වය මගින් කරන සමස්ථයට ඇති අයිතිවාසිකම්ය".

බුද්ධිමය දේපළ පනත විශාල වපසරියක් ආවරණය කරයි. එනම් කාර්මික, විද්‍යාත්මක, සාහිත්‍ය, කලා, සෞන්දර්යාත්මක ක්ෂේත්‍රවල සිදු කරන නව නිර්මාණ බුද්ධිමය දේපල පනත මගින් ආවරණය කෙරේ.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

එයට අමතරව නවකථා, කෙටිකථා, නාට්‍ය චිත්‍රපට සංගීත කෘති ඡායාරූප මූර්ති පරිගණක වැඩසටහන් ගෘහ නිර්මාණ සැලසුම් වෙළඳ සන්නාම, ශාඛ අභිජනන අයිතිය හා පේටන් බලපත්‍ර ද බුද්ධිමය දේපළ පනතට අයත් වේ. ඉහත දක්වා ඇති කෂේත්‍ර වලට අදාලව සිදු කරනු ලබන නව නිර්මාණවල නිර්මාණකරුවන්ගේ අයිතිය සුරක්ෂිත කරදීම මෙම පනත මගින් සිදු කරයි.

මෙම පනතේ 06 වන වගන්තිය සුවිශේෂී වේ. මෙම වගන්තිය මගින් සාහිත්‍ය කලාත්මක සහ විද්‍යාත්මක ක්ෂේත්‍රවල මුල්ම බුද්ධිමය නිර්මාණ සඳහා ආරක්ෂාව සලසා ඇත. මෙම පනත මගින් නිර්මාණකරුවෙකුට ප්‍රකාශන හිමිකම දෙයාකාරයකින් හිමකර දී ඇත. එනම් ආර්ථික අයිතිවාසිකම් සහ සදාචාරාත්මක අයිතිවාසිකම් වශයෙනි.

මෙම පනතේ 9(1) වගන්තිය ද වැදගත් වේ. එමගින් නිර්මාණයක හිමිකරුට පමණක් හිමිවන අයිතිවාසිකමක් පිළිබඳව සඳහන් වේ. එනම් ආර්ථික අයිතිවාසිකමයි. මෙම ආර්ථික අයිතිවාසිකම යටතේ නව නිර්මාණයක හිමිකරුට පමණක් එම නිර්මාණය ප්‍රතිනිශ්පාදනය කිරිම, පරිවර්තනය කිරිම බෙදා හැරිම, කුලියට දිම, ආනයනය කිරිම, ප්‍රදර්ශනය කිරිම විකාශය කිරිම සන්නිවේදනය කිරිම සඳහා අයිතිය පවති.

එමෙන්ම ආර්ථික අයිතිවාසිකමේ මුල් අයිතිය රදා පවතින්නේ කතෘත්වයේ ස්වභාවය මතයි. ඒ අනුව හවුල් නිර්මාණයක දි අදාල පාර්ශ්ව වලට ආර්ථික අයිතිවාසිකමේ කතෘත්වය හිමිවේ.

මෙම පනත මගින් විග්‍රහ කරනු ලබන තවත් කරුණක් නම් සාධාරණ භාවිතයයි(Fair use) සාධාරණ භාවිතය යනු හිමිකම් අයිතිය උල්ලංඝනය කිරිමක් නොවන අතර විවේචනය, විචාරය, ප්‍රවෘත්ති වාර්තාකරණය, ඉගැන්විම, ශිෂ්‍යත්ව හෝ පර්යේෂණ සඳහා ආදි වෙනත් කාර්යය යොදා ගැනිමට ඇති අවසරයයි.

<u>භාවිතයට සාධාරණ ද යන්න තීරණය කිරිම සඳහා සලකා බැලිය යුතු කරුණු හතරක් ඇත.</u>

- භාවිතය සහ එහි ස්වභාවය.
- හිමිකම් ආරක්ෂා කර ඇති කාර්යයේ ස්වභාවය.
- සම්පූර්ණ හිමිකම් සහිත කාර්යය වලදි භාවිතා කරනු ලබන කාර්ය ප්‍රමාණය.
- හිමිකම් ආරක්ෂා කල කාර්ය වෙළෙඳ පොළ සඳහා භාවිත කිරිම සඳහා ඇති බලපෑම.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

## 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනිමේ පනත

තොරතුරු දැන ගැනිමේ පනත ශ්‍රී ලංකාව තුළ 2016 වර්ෂයේ දි සම්මත කරගත් සුවිශේෂී පනතකි. මෙතුළින් මහජනයාට රාජ්‍ය ආයතන වලින් තමන්ට අවශ්‍ය තොරතුරක් ලබා ගැනිමේ ඇති අයිතිය තහවුරු කරයි.

එමෙන්ම රාජ්‍ය අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලු කටයුතු සම්බන්ධයෙන් ජනතාවට අවශ්‍යවන තොරතුරු ලබාදිමට මෙමගින් අදාල රාජ්‍ය ආයතනය බැදි සිටි. එහෙත් රාජ්‍ය සහ ජාතික ආරක්ෂාව සම්බන්ධ තොරතුරු, සංවේදි තොරතුරු ලබාදිම ප්‍රතික්ෂේප කිරිමට ද රජයකට හැකිය. මෙම කටයුතු මෙහෙයවිමට සහ පැමිණිලි විභාග කිරිම සඳහා 2017 පෙබරවාරි 02 දින තොරතුරු දැන ගැනිමේ කොමිසම පිහිටුවනු ලැබිය.

ප්‍රතිපත්ති සම්පාදනය සදහා මහජන සහභාගිත්වය වැඩි දියුණු කිරිමේ අරමුණින් විනිවිධ භාවය, රාජ්‍ය වගකිම, පොදු මහජන ආරක්ෂාව හා දූෂණයට එරෙහිව තොරතුරු ලබා ගැනිමේ අයිතිය මෙමගින් තහවුරු කෙරේ. ප්‍රවේශවිමේ හැකියාව, මුද්‍රිත ලේඛණ, පරිගණක ලිපි ගොණු, ලිපි, විද්‍යුත් තැපැල්, ඡායාරූප, ගිවිසුම්, සැලසුම් හා ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරිම යනාදිය මෙයට ඇතුලත් වේ. ඕනෑම තොරතුරක් යන්නට රාජ්‍ය භාෂාව විභාග කටයුතු පෞද්ගලික වෛද්‍ය වාර්තා යනාදි ව්‍යතිරේක ගණනාවක් ද මීට ඇතුළත් වේ.

මෙහි ඓතිහාසික පසුබිම පිළිබඳව විමසිම වැදගත් වේ.

ලෝකයේ මුල්ම තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රතිපත්ති ගත කිරිම සඳහා නිති සම්මත කරන ලද්දේ 1766 ස්විඩනයේදීය. 1940 දී එක්සත් ජාතින්ගේ මහා මණ්ඩල සැසිවාරය (59) (1) විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය සම්මත කරන ලදී. 1966 දී ඇමෙරිකාව තම ප්‍රතිපත්ති සඳහා තොරතුරු දැන ගැනිම නිතිගත කර තිබේ. එමෙන්ම යුරෝපිය කවුන්සිලය විසින් රාජ්‍ය ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන තොරතුරු සඳහා ප්‍රවේශීය පිළිබද නිර්දේශ සමාජික රටවල් වෙත ලබා දෙන ලදී.

මෙම ක්‍රියාවලිය එනම් තොරතුරු දැනගැනිමේ අයිතිය සාර්ථක කරගැනිම සඳහා රාජ්‍ය යාන්ත්‍රණය නිලධාරින්ගේ සේවය ජනතාවගේ දැනුවත්භාවය වැදගත් වේ.

## මාධ්‍ය නිදහස

පුද්ගල නිදහසේ දිගුවක් ලෙස පුවත්පත් නිදහස දැක්විය හැකිය. පුවත්පත් නිදහසේ වර්ධනීය අවස්ථාව මාධ්‍ය නිදහස වේ. මෙයින් අදහස් කරන්නේ විද්‍යුත් හෝ මුද්‍රිත හෝ කවර මාධ්‍යයකින් වුවද සිදු කරන සන්දේශ විසරණය සඳහා ප්‍රකාශනයේ නිදහස අත්‍යවශ්‍ය වන බවයි.


**Udaya Amaraweera, University visiting lecturer.
BA, University of J'Pura, MA & M.Phil in
Mass.Com, University of Kelaniya.
Voice : 0711715342**

**1948 දෙසැම්බර් මස 10 වැනිදා මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන් ප්‍රකාශන නිදහස පිළිබඳව මුල් වරට කරුණු ඉදිරිපත් කරන ලදී.**

**මාධ්‍ය නිදහස මගින් පැහැදිළි කරනු ලබන්නේ ග්‍රාහකයාට ලැබෙන තොරතුරු විශ්ලේෂණයට සහ විචාරයට බඳුන් කිරිමේ හැකියාවයි. මේ තුළින් ග්‍රාහකයාගේ දැනුවත්භාවය වර්ධනය වේ.**

**ඒක පාර්ශ්විකව තොරතුරු ලබාදිම පමණක්ම නොව බහු පාර්ශ්විකව තොරතුරු සමාජයට ලබාදිම මාධ්‍ය නිදහස මගින් අපේක්ෂා කෙරේ.**

**අන්තර්ජාලය සහ පරිගණක සේවා බහුලවිමෙන් මාධ්‍ය නිදහස යන සංකල්පය අභියෝගයට ලක්වි තිබේ.**

**විශේෂයෙන්ම අන්තර්ජාලය සහ සමාජ ජාල භාවිතයත් සමගම පාලනයකින් තොරව තොරතුරු ගලායාම නිසා මාධ්‍ය නිදහස යන්න අභියෝගයට ලක් වී තිබේ.**

## 10.2 මාධ්‍ය නියාමනය.

**නියාමනය යනු යම් ආකාරයකට පාලනයකට ලක් කිරිමක් වශයෙන් හැදින්විය හැකිය. මෙම පාලන ක්‍රියාවලිය යම් ආකාරයක නිශ්චිත නිතිරිති රෙගුලාසි උපදෙස් මාලාවකට අනුව සිදු විය හැකිය.**

**නියාමනය යන්න තවදුරටත් විද්‍යාත්මකව විග්‍රහ කළහොත් මහජන ආයතනයක් විසින් ප්‍රජාවගේ පිළිගැනිමට ලක් වු ක්‍රියාකාරකම් පිළිබඳව බල පවත්වනු ලබන ඉලක්ක ගත පාලනයක් නියාමනයක් ලෙස හැදින්විය හැකිය. එමෙන්ම නියාමනය නුතන මාධ්‍ය කර්මාන්තයේ භාවිත වන කැපී පෙනෙන සංකල්පයක් වශයෙන් ද හැදින්විය හැකිය.**

**නියාමනය යන්න ධනාත්මකව මෙන්ම ඍණාත්මක ආකාරයෙන් ද ක්‍රියාත්මක වනු දැකගත හැකිය. උදා: කිසියම් පිළිගත් ප්‍රමිතියක් සහිතව ප්‍රවෘත්ති විකාශය කිරිමට ඉඩ සැලසිම ධනාත්මක නියාමනයකි. යම් වැදගත් සන්දේශයක් මාධ්‍යයෙහි ඉදිරිපත්විම වැළැක්විම ඍණාත්මක නියාමනයකි.**

**නියාමනය යන්න එක් එක් මාධ්‍යයට විශේෂිතව හදුනාගත හැකිය. එනම් මුද්‍රිත මාධ්‍ය නියාමනය සහ විද්‍යුත් මාධ්‍ය නියාමනය වශයෙනි.**

**මාධ්‍ය නියාමනය විශේෂ අවධානයකින් යුක්ත ක්‍රියාවලියක් බවට පත්වන්නේ ජනමාධ්‍ය ඇරඹීමත් සමගය. මුල් යුගයේ දී මාධ්‍ය නියාමනය සිදු කෙරුණේ රටේ පාලකයාගේ බලය පවත්වා ගැනිමට සිදුවන බලපෑම පදනම් කොට ගෙනය. එමෙන්ම මුල් කාලයේ දි රජුට පක්ෂපාත ලෙස මාධ්‍ය ක්‍රියාකරන්නේ ද යන්න සොයා බැලිමට මාධ්‍ය නියාමනයට ලක් කරිණ.**



**Udaya Amaraweera, University visiting lecturer.
BA, University of J'Pura, MA & M.Phil in Mass.Com,
University of Kelaniya.
Voice : 0711715342**

එයට අමතරව 15 සියවස මැද භාගයේ දි මුද්‍රණ යන්ත්‍ර භාවිතයෙන් බටහිර යුරෝපයේ පොත් මුද්‍රණය ආරම්භ වීමත් සමගම මාධ්‍ය නියාමනය ද බිහිවිය. මුද්‍රණ ව්‍යාපාරයක් මෙන්ම කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත විමට පටන්ගත් විට එකල පල්ලිය සහ රජය පළ කරන ලද මුද්‍රිත ප්‍රකාශවල අන්තර්ගතය පිළිබඳව සොයා බලන ලදී. ඉන් අනතුරුව ප්‍රකාශන මුද්‍රණය කිරිමට පෙර කිසියම් බලධාරියෙකුගේ අනුමැතිය ගැනිමටත් ආනයනයේ දි සහ අපනයනයේ දි කිසියම් පාලනයකට නතු කිරිමට කටයුතු කරන ලදි.

<u>මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව</u>

නිදහස් සමාජයක ජන මාධ්‍ය නිසලෙස හැසිරවිම සඳහා නියාමනය වැදගත්වේ. ඒ අනුව මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාවය කරුණු හයක් යටතේ පහත ලෙස දැක්විය හැකිය.

- තොරතුරු සමාජයක පවත්නා විවිධ සන්නිවේදන විධික්‍රම ආර්ථික සම්පතකි. එබැවින් ඒවා කළමනාකරණය කිරිමට නියාමනය අවශ්‍ය වේ.
- මහජන සාමය ආරක්ෂා කිරිමට නියාමනය අවශ්‍යවේ.
- පාලනය නොකරන ලද පොදු මහජන සන්නිවේදන ක්‍රම මගින් තනි පුද්ගලයන්ගේ අයිතියට සිදුවන බලපෑම පාලනය කිරිමට නියාමනය අවශ්‍ය වේ.
- තාක්ෂණික ප්‍රමිතිකරණය, නවෝත්පාදනය, අන්තර් සම්බන්ධතා මත පදනම් වූ සන්නිවේදන ක්‍රමවේදවල සංවර්ධනයට සහ ඵලදායි භාවිතයට නියාමනය අත්‍යවශ්‍ය වේ.
- තමන් තෝරාගත් සන්නිවේදනාත්මක හා සංස්කෘතික භාවිතය මත පදනම්ව තොරතුරු වෙත ප්‍රවේශවිම සන්නිවේදනයේ නිදහස විවිධත්වය සහ විශ්විය වටිනාකම් ප්‍රවර්ධනයට නියාමනය වැදගත් වේ.
- මාධ්‍ය සේවාවල නිදහස් වෙළෙඳ පොළ භාවිතය ප්‍රවේශවිමේ තරගකාරිත්වය පාරිභෝගික අයිතිය යනාදිය පවත්වා ගෙන යාමට නියාමනය වැදගත් වේ.

<u>නියාමන වර්ග</u>

ලෝකයේ මාධ්‍ය නියාමනය සඳහා භාවිතා කරන මුලික ප්‍රවේශ හතරක් හඳුනාගත හැකිය.

**01.** ස්වයං නියාමනය **( Self-Regulation)**
**02.** සහනියාමනය **( Co regulation)**
**03.** ව්‍යවස්ථාපිත නියාමනය **( Status regulation)**
**04.** අභ්‍යන්තරික නියාමනය **( In-house regulation)**

**Udaya Amaraweera, University visiting lecturer.
BA, University of J'Pura, MA & M.Phil in
Mass.Com, University of Kelaniya.
Voice : 0711715342**

<u>ස්වයං නියාමනය</u>

**පූර්ණ වශයෙන් රජය මැදිහත් නොවී මාධ්‍ය ක්‍රියාවලියට සම්බන්ධ වෘත්තිකයන් එකතු වී ගොඩනගා ගනු ලබන ක්‍රියාවලියකි. මෙහිදී රාජ්‍ය මැදිහත්විමකින් තොරව මාධ්‍ය මගින් ස්වේච්ඡාවෙන්ම මෙම නියාමන ක්‍රමවේද ක්‍රියාත්මක කරයි. එමෙන්ම ආචාර ධර්ම / මාර්ගෝපදේශ සකස් කිරිමේ ක්‍රියාවලියට මාධ්‍ය වෘත්තිකයෝ සම්බන්ධ වෙති. එයට අමතරව හඳුන්වා දෙන ලද නියාමනයන් මාධ්‍ය තුළ ක්‍රියාත්මක වන්නේදැයි විමසා බැලිම සඳහා ද මාධ්‍ය වෘත්තිකයන් සම්බන්ධ වේ. එමෙන්ම නියාමන සකස් කිරිමේ ක්‍රියාවලියට මහජන නියෝජනයක් ලබාදිමේ අරමුණින් සිවිල් සමාජ සංවිධාන නියෝජිතයෝ හා පර්යේෂකයෝ සහභාගි වෙති. මාධ්‍ය මුහුණ දෙන සැබෑ ගැටලු හඳුනා ගැනිමටත් ඒවාට කඩිනමින් පියවර ගැනිමටත් මේ යටතේ අවස්ථාව සැලසේ. මෙහි ඇති ගැටලුව නම් මෙම නියාමන පිළිනොගෙන සිටිමට මාධ්‍ය ආයතන වලට හැකියාව තිබිමයි. එමෙන්ම නිතිමය බැදිමක් ද නොමැත. උදා: කර්තෘ සංසදය.**

<u>සහනියාමනය</u>

**මෙහිදී නියෝජිතයන්ගේ මැදිහත් විමක් සහිතව මෙම නියාමනය ගොඩනගා ගනු ලබයි. එමෙන්ම මෙයට නිතිමය බලයක් ඇත. මෙම නියාමනයන් ගොඩ නැගිම සඳහා මාධ්‍ය හිමිකරුවන්, මාධ්‍ය සංස්කාරකවරුන්, මාධ්‍යකරුවෝ එක්වේ. ඉහත සියල්ලන්ගේම දායකත්වයෙන් ආචාර ධර්ම මාර්ගෝපදේශ සකස් කෙරේ. මෙමගින් ලබා දෙන තින්දු හා නිර්දේශ මාධ්‍ය ආයතන වලට නොසලකා හැරිය නොහැක. එමෙන්ම රජයේ මැදිහත්විමක් ද පවති. උදා: පුවත්පත් පැමිණිලි කොමිසම.**

<u>ව්‍යවස්ථාපිත නියාමනය</u>

**මාධ්‍ය ආයතනවල මැදිහත්විමක් හෝ සහභාගිත්වයක් නොමැතිව ක්‍රියාත්මක කරනු ලබන නියාමන විධි ක්‍රියාවකි. සිවිල් සමාජ කණ්ඩායම්, නිතිඥ සංගම්, ශාස්ත්‍රිය පර්යේෂකයෝ නියාමන මණ්ඩලවල සමාජිකත්වය දරති. ඇතැම් අවස්ථාවලදි පාර්ලිමේන්තුව මගින් හෝ කිසියම් මණ්ඩලයක් විසින් මේ සඳහා සාමාජිකයන් පත් කරයි. මොවුන් මාර්ගෝපදේශ සකස් කිරිම හා ඊට අදාළ නිරික්ෂණ කටයුතු සිදු කරයි.**

**මෙම නියාමන ක්‍රියාවලිය නිසා මාධ්‍යවල ස්වාධිනත්වය ගිලිහි යාමට හැකිය. උදා: ප්‍රවෘත්ති බලධරයාගේ භූමිකාව, විදුලි සන්දේශ නියාමන කොමිසන් සභාව, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය.**

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

<u>අභ්‍යන්තර නියාමනය.</u>

**ඇතැම් ආයතන තම නියාමන ක්‍රියාවලිය ආයතන මට්ටමෙන් අභ්‍යන්තරිකව පවත්වා ගෙන යයි. ඒ සඳහා මාධ්‍ය ආයතන තම ආයතනය වෙනුවෙන් ඔම්බුඩ්ස්මන්වරයෙකු(Ombudsman) පත් කරයි. මේ සඳහා ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදියෙකු තෝරා ගනු ලබයි. මාධ්‍ය ආයතනය සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සංස්කාරකවරුන්ට දැනුම්දීමටත් ගතයුතු පියවර නිර්දේශ කිරීමත් ඔම්බුඩ්ස්මන්වරයාගේ (Ombudsman) කාර්යය වේ.**

**මෙහිදී නියාමන ආයතන කිහිපයක් හඳුනා ගැනීම සහ ඒවායේ කාර්යය භාර්යය විමසීම වැදගත් වේ.**

<u>ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය( **Public Performance Board)**</u>

**1972 ඉංග්‍රීසි යටත් විජිත පාලන කාලයේ පනවන ලද තීරණයකින් ආරම්භ වූ ක්‍රියාවලියකි. සංදර්ශන, ප්‍රසංග, චිත්‍රපට යනාදිය මහජන ප්‍රදර්ශනයට පෙර නිරීක්ෂණය කර ඊට අදාළ නියාමන කටයුතු වල යෙදීම මෙහි මූලික අරමුණ වේ. සිනමා කෘතියක් හෝ වේදිකා නාට්‍යයක් මහජන ප්‍රදර්ශනයට තැබීමට පෙර මුලින් එහි පිටපතක් ද නිෂ්පාදනය කළ පසුව මුල් දර්ශන ද රැඟුම් පාලක මණ්ඩලයට නැරඹීම සඳහා ඉදිරිපත් කළ යුතුය.**

**ලිංගික හෝ අසැබි දර්ශන, පුද්ගල අපහාස, සමාජ අගතිගාමී ඉදිරිපත් කිරීම් යනාදිය විවිධ වාරණයන්ට ලක් කරනු ලබයි.**

**1951 අංක 23 දරන පනතින් මෙම ආයතනය ස්ථාපිත කරන ලදි. මෙමගින් චිත්‍රපට මහජන ප්‍රදර්ශනය සඳහා මුදා හැරීමේ දී පහත ලෙස වර්ගීකරණයට ලක් කරයි.**

**U සහතිකය -** ***අසීමාන්ත මහජන ප්‍රදර්ශනයට සුදුසුය. කිසිම බාධාවකින් තොරව සෑම කෙනෙකුටම නැරඹිය හැකිය.***

**X සහතිකය -** ***වැඩිහිටියන්ට පමණක් සුදුසුය. අවුරුදු 18 වැඩි ඕනෑම කෙනෙකුට නැරඹිය හැකිය.***

**A සහතිකය -** ***වැඩිහියන්ට වඩාත් සුදුසුය. වැඩිහිටියන් සමග පැමිණෙන අවුරුදු 18 අඩු ළමයින්ට ද නැරඹිය හැකිය.***

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

රැගුම් පාලක මණ්ඩලය සඳහා සමාජිකයන් පත් කිරිම අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ කටයුත්තකි.

<u>ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය.( Sri Lanka Press Council).</u>

1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ මෙය පවත්වා ගෙන යනු ලැබේ. මෙම මණ්ඩලය පුද්ගලයන් 07 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙහි ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා නිලබලයෙන් පත් කරයි. සෙසු සමාජිකයන් ජනාධිපතිවරයා විසින් පත් කරයි.

පුවත්පත් වල වෘත්තිය තත්ත්වය ඉහල නැංවිම, පුවත්පත් නිදහස ආරක්ෂා කිරිම, පුවත්පත් ආචාර ධර්ම පවත්වා ගෙන යාම, පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ හැගීමක් ඇති කිරිම මෙහි මූලික පරමාර්ථ වේ.

පුවත්පත් ආචාර ධර්ම කඩ කිරිම පිළිබඳ මහජන පැමිණිලි විභාග කරනු ලබන්නේ සභාපතිවරයාය ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. මෙම මණ්ඩලයට පුවත්පත්වල ආචාරධර්ම කඩ කිරිම් පිළිබඳ කරුණු විභාග කර තින්දු ප්‍රකාශයට පත් කළ හැකිය. එමෙන්ම මෙයට අධිකරණ බලතල අර්ධ වශයෙන් ලබා දි ඇත.

පුවත්පත් කොමසාරිස්වරයා මෙම මණ්ඩලයේ පරිපාලන කටයුතු මෙහෙයවයි. එමෙන්ම මොහු පුවත්පත් පරික්ෂා කර ඒවායේ ඇති ආචාර ධර්ම කඩවන අවස්ථා පිළිබදව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කරවනු ලැබේ.

මෙරට ප්‍රකාශනයට පත්වන සෑම පුවත්පතක්ම මෙම මණ්ඩලයේ වාර්ෂිකව ලියා පදිංචි විය යුතුය.

මෙහි මූලික පරමාර්ථ කිහිපයක් පහතින් දැක්වේ.

- ශ්‍රී ලංකාවේ පුවත්පත් නිදහස සුරක්ෂිත කිරිම, ඒ නිදහසින් අයුතු ප්‍රයෝජන ගැනිම වැළැක්විම හා සම්මත උසස්ම වෘත්තිය තත්ත්වයකට අනුකූලව ශ්‍රී ලංකාවේ පුවත්පත්වල ස්වරූපය ආරක්ෂා කිරිම.

- කරුණු පිළිබඳ සත්‍ය ප්‍රවෘත්ති ලෙස පුවත්පත්වල පළ කිරිමේ සහ කරුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශ පදනම් කරගත් අදහස් පුවත්පත්වල පළ කිරිමේ නිදහස සුරක්ෂිත කිරිම.

- පුවත්පත් හා පත්‍ර කලාවේදීන් උසස් පත්‍රකලාවේදි ආචාරධර්ම පවත්වා ගෙන යනු ලැබිම ගැන වගබලා ගැනිම හා පුරවැසි අයිතිවාසිකම් හා වගකිම් යන දෙකරුණ පිළිබඳ නිසි හැගීමක් වඩාලිම.

Udaya Amaraweera, University visiting lecturer.
BA, University of J'Pura, MA & M.Phil in
Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

- පත්‍ර කලාවේදී වෘත්තියෙහි සේවයට බඳවා ගැනීමේ ක්‍රම, සුභ සාධනය අධ්‍යාපනය හා පුහුණු කිරීම වැඩි දියුණු කිරීම.

<u>ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව</u>

**<u>( Sri Lanka Telecommunication Regulatory Commission – SLTRC)</u>**

**1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සන්දේශ(සංශෝධිත) පනත යටතේ ස්ථාපිත ආයතනයකි. විද්‍යුත් මාධ්‍ය ලෙස සැලකෙන ගුවන්විදුලි සහ රූපවාහිනී මාධ්‍ය නියාමනය සඳහා පිහිටවූ ආයතනයකි. එමෙන්ම ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකා ප්‍රචාරයට අවශ්‍ය ගුවන්විදුලි තරංග පරාසයන් ලබාදීමේ බලතල ඇත්තේ ද මෙම ආයතනයට වේ. එමෙන්ම ගුවන්විදුලි තරංග පරාසයන් නැවැත පවරා ගැනීමේ හෝ තහනමට ලක් කිරීමේ බලතල ද මෙම ආයතනය සතුවේ. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවේ අවසරයකින් තොරව ගුවන්විදුලි හෝ රූපවාහිනී සම්ප්‍රේෂණයේ යෙදීම තහනම් වේ.**

**මෙම කොමිසමේ කටයුතු අතර විදුලි සන්දේශ සැපයීමේ දී ඊට අදාළ උපාංගවල ගුණාත්මකභාවය පිළිබඳ කටයුතු කිරීම, නව විදුලි සන්දේශ ක්‍රමෝපායන් ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණු අතර වැදගත් වේ.**

**ජංගම දුරකථන භාවිතයේ දී ග්‍රාහකයන්ට මතුවන ගැටලු පිළිබඳව මෙම කොමිසමට පැමිණිලි කළ හැකිය. එමෙන්ම එම පැමිණිලි භාරගෙන ඒවාට විසඳුම් ලබාදීමට කොමිසම බැඳි සිටියි.**

**ජනාධිපතිවරයා විසින් මෙම කොමසමේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරයි. කොමිසමේ තීරණ ගනු ලබන්නේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය මගිනි. එමෙන්ම පරිපාලන කටයුතු සිදු වන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේය.**

**Udaya Amaraweera, University visiting lecturer.
BA, University of J'Pura, MA & M.Phil in
Mass.Com, University of Kelaniya.
Voice : 0711715342**

## ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිශන් සභාව
## (Press complaints commission of Sri Lanka – PCCSL)

ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, පුවත්පත් ප්‍රකාශකයන්ගේ සංගමය යන ආයතන ඒකාබද්ධව පිහිට වූ ආයතනයකි. මෙය ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයට අනුබද්ධව 2003 වසරේ දි පිහිටවනු ලැබීය.

ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් ස්වේච්ඡාවෙන් සකස් කර ඇති වෘත්තීය ප්‍රතිපත්ති මාලාව කිසියම් පුවත්පත් කතුවරයකු හෝ පත්‍රකලාවේදියෙකු කඩ කළ විට ඊට එරෙහිව හානි වූ තැනැත්තාට පුවත්පත් පැමිණිලි කොමිසමට පැමිණිලි කළ හැකිය. මෙහිදි අගතියට පත් මහජනතාවගෙන් ලිඛිතව ලැබෙන පැමිණිලි විභාග කරනු ලබයි. මෙහිදි දෙපාර්ශ්වය කැඳවා ප්‍රශ්නය සමථයකට පත් කිරිමට අධිකරණය මගින් බේරුම් කිරිමට සාමදාන කිරිමට පුවත්පත් පැමිණිලි කොමිසම මැදිහත් වෙයි.
එමෙන්ම යම් පුද්ගලයකුගෙන් පැමිණිල්ලක් ලැබුණු විට අදාළ පුවත්පත් ආයතනයට යොමු කර ඊට අදාළ කරුණු විමසා බලා නිවැරදි කිරිමක් පළ කිරිමට පුවත්පත් ආයතනයෙන් කොමිසම ඉල්ලා සිටියි. ලැබෙන පැමිණිලි විභාග කිරිමට පුවත්පත් මාධ්‍ය මෙන්ම වෙනත් ක්ෂේත්‍රවලට අයත් විද්වතුන්ගෙන් සමන්විත මණ්ඩලයක් මගින් සිදු කරයි.

## ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය( Sri Lanka Computer Emergency Readiness Team, Coordination – CERTCC).

ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් ( **Information and communication Technology Agency – ICTA** ) යටතේ 2006 වර්ෂයේ දී පිහිටුවන ලද ආයතනයකි. රටේ ජාතික සයිබර් ආරක්ෂණ ආයතනය වශයෙන් ක්‍රියාත්මක වේ.
එමෙන්ම විවිධ සංවිධාන සහ පුද්ගලයන් විසින් සිදු කරනු ලබන සයිබර් අපරාධ සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්විම සිදු කරයි.
මෙම සංසදයේ කාර්යයන් අතර මූල්‍ය හා වෙනත් අපරාධ පිළිබඳව විමර්ශනය කිරිම, ත්‍රස්තවාදි සංවිධාන වල ක්‍රියාකාරිත්වයට එරෙහිව දැනුවත් කිරිම අනතුරු හැගවිම විසඳුම් ලබාදිම වැදගත් වේ.

මෙයට අමතරව පරිගණක ගැටලු සම්බන්ධයෙන් වන මහජන පැමිණිලි විමර්ශනය කර ඊට අදාළ විසඳුම් ලබාදිම සිදු කරයි.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

# 10.3 මාධ්‍ය අචාර ධර්ම හා මාර්ගෝපදේශ

මාධ්‍ය ආචාර ධර්ම

**ආචාර ධර්ම යනුවෙන් හඳුන්වන්නේ නිතිරීති පද්ධතියක් නොවේ. යම් වෘත්තියක නියෙලෙන අය විසින්ම තමන් වෙත පනවාගත් විනය නිති පද්ධතියක් වශයෙන් හැදින්විය හැකිය. නිදසුනක් ලෙස ගුරුවරු, වෛද්‍යවරු, නිතිවේදින්, ගණකාධිකාරිවරුන් ගත හැකිය. මෙම වෘත්තිකයන් විසින් තමන්ගේ කටයුතු ගුණාත්මක මට්ටමකින් සිදු කර ලිම සඳහා විවිධ වු නිතිරිති චර්යාධර්ම මාලාවන් ඔවුන් විසින්ම ගොඩනගා ගෙන තිබේ. මේවා ආචාර ධර්ම වශයෙන් හැදින්විය හැකිය.**

**20 වැනි සියවසේ මාධ්‍ය භාවිතය සමග වැඩුණු ප්‍රධාන ධාරාවක් ලෙස මාධ්‍ය ආචාරධර්ම හැදින්විය හැකිය. මාධ්‍ය ආචාර ධර්ම සකස් කිරිමේ දි ප්‍රධාන වශයෙන් විෂය මුලික බව, වගකිම, සාධාරණබව යනාදිය පිළිබඳව සලකා ලබනු ලැබේ. එමෙන්ම මාධ්‍ය ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදිමේ මුලික අරමුණ වන්නේ වගකිම් සහගත මාධ්‍ය භාවිතයෙන් යුත් වෘත්තිකයෙකු බිහිකර ගැනිමයි.**

**මාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහ පිළිබඳව විමසිමේ දි ඒවායේ දක්නට ලැබෙන පොදු කරුණ කිහිපයක් හඳුනාගත හැකිය. එනම් පෞද්ගලිකත්වය, නිරවද්‍යතාව, මුලාශ්‍රය හෙළි නොකිරිම, පිළිතුරුදිමේ අයිතිය වැනිදෑය. එමෙන්ම මාධ්‍ය ආචාර ධර්ම සකස් කරන්නේ ඒ ඒ ක්ෂේත්‍ර වලට අයත් වෘත්තිකයන් විසිනි. ඇතැම් අවස්ථා වල මේවාට නිතිමය බැදිමක් ද ඇත.**

**මාධ්‍ය ආචාර ධර්ම ගොඩනැගිමේ දි සමාජයේ පිළිගනු ලබන පොදු වටිනාකම් උපයෝගි කොටගනු ලැබේ. එමෙන්ම ආචාරධර්ම පද්ධති සමාජයෙන් සමාජයට වෙනස් වේ.**

මාධ්‍ය මාර්ගෝපදේශ

**බොහෝ මාධ්‍ය ආයතන විසින් තම මාධ්‍ය ආයතනය ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව විවිධ නිර්නායක ඉදිරිපත් කර තිබේ. මෙම නිර්නායකයන්ට අනුගත වෙමින් අදාළ මාධ්‍ය ආයතනයේ පුද්ගලයන් කටයුතු කළ යුතු වේ. මේවා මාධ්‍ය මාර්ගෝපදේශ වශයෙන් හැදින්විය හැකිය.**

**මාධ්‍ය ක්‍රියාවලිය කිසියම් විධිමත් ආකාරයකට පවත්වා ගෙන යාමේ අරමුණින් මාර්ගෝපදේශ සකස් කර තිබේ. ලෝකයේ ජනමාධ්‍ය ආයතන විසින් තම ආයතනයේ විවිධ වැඩසටහන් ඉදිරිපත් කළ යුතු ආකාරය පිළිබඳව විවිධ මාර්ගෝපදේශ හඳුන්වා දි තිබේ. විශේෂයෙන්ම වැඩසටහන් වලට යොදාගත යුතු භාෂව, නිවේදන කාර්ය භාර්ය කරුණු වාර්තා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබේ.**

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

මුද්‍රිත මාධ්‍ය ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි එක් එක් මාධ්‍ය සඳහා වෙන්වෙන් වශයෙන් මාර්ගෝපදේශ හඳුන්වා දී තිබේ. විශේෂයෙන්ම වෙළඳ දැන්වීම් ඉදිරිපත් කිරීමේ දී මෙම උපදෙස් වලට අනුව කටයුතු කළ යුතුය.
මෙම උපදෙස් වලට පයහැනිව සකස් කරන වැඩසටහන් වෙළඳ දැන්වීම් ප්‍රචාරයෙන් ඉවත් කිරීමේ බලතල බලධාරින් සතුවේ. එමනිසා යහපත් මාධ්‍ය සංස්කෘතියක් මාධ්‍ය මාර්ගෝපදේශ වැදගත් වේ.

<u>පුවත්පත් ආචාර ධර්ම</u>

1973 අංක දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ 1981 දි පුවත්පත් කලාවෙදින්ට ආචාර ධර්ම සංග්‍රහයක් හඳුන්වා දී ඇත. එය සකස් කර ඇත්තේ එවක පුවත්පත් වල ප්‍රධාන සංස්කාරකවරුන් 25 දෙනෙකුගෙන් සමන්විත වූ මණ්ඩලයකිනි. මෙම ආචාර ධර්ම ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කර ඇති බැවින් ඊට නිතිමය බැදීමක් ද තිබෙන බව පෙන්වා දිය හැකිය.

2003 වර්ෂයේ දී ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් ද වෘත්තිය මාර්ගෝපදේශ සංග්‍රහයක් ප්‍රකාශයට පත් කෙරිණ.

එය අවස්ථා දෙකක දි යාවත්කාලින කර ඇති අතර එය පුවත්පත් කලාවේදින් සඳහා සකස් කළ ස්වයං නියාමන ක්‍රමවේදයක් ලෙස නම් කර තිබේ.

ඊට අමතරව විවිධ පුවත්පත් තම ආයතනයට පමණක් බලපාන අයුරින් සකස් කර ගත් විවිධ ආචාරධර්ම ක්‍රම හඳුනාගත ගත හැකිය. පුවත්පත් වාර්ථකරණයේ දී අනුගමණය කළ යුතු පිළිගත් දැන්වීම් ප්‍රතිපත්ති යනාදිය ඒ අනුව තිරණය කෙරේ. උදා: ශ්‍රී ලංකා පුවත්පත් මණඩල ආචාර ධර්ම, කර්තෘ සංසදය ඉදිරිපත් කළ ආචාර ධර්ම පද්ධතිය.

<u>ගුවන්විදුලි ආචාර ධර්ම.</u>

ගුවන්විදුලි මාධ්‍ය සඳහා වූ විශේෂ ආචාර ධර්ම පද්ධති සකස් කර නැත. නමුත් 1966 අංක 25 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනතේ සඳහන් වගන්ති වලට අනුව වැඩසටහන් කරණයේ දි අනුගමණය කළ යුතු උපදෙස් මාලාවක් හඳුන්වා දී තිබේ. මෙයට අමතරව ගුවන්විදුලි මාධ්‍ය සඳහා දැන්වීම් ලබා ගැනිමේ දි අනුගමණය කළ යුතු උපදෙස් මාලාවක් ගුවන්විදුලි සංස්ථාව විසින් පෙන්වා දි තිබේ.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

<u>රූපවාහිනී ආචාරධර්ම</u>

රූපවාහිනී මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් නිශ්චිත ලෙස ගොඩනගාගත් ආචාර ධර්ම පද්ධතියක් බිහිව නැත. 1982 දී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ ඇතුලත් කරුණු රූපවාහිනී මාධ්‍ය සඳහා භාවිතයට අදාල උපදෙස් ලෙස භාවිතා වේ. එමෙන්ම මෙහි රූපවාහිනී මාධ්‍ය සඳහා දැන්වීම් ලබා ගැනීමේ දී අනුගමණය කළ යුතු මාර්ගෝපදේශ සංග්‍රහයක් අන්තර්ගතව පවතී.

<u>නව මාධ්‍ය ආචාර ධර්ම.</u>

නව මාධ්‍ය ලෙස හඳුන්වනු ලබන වෙබ් අඩවි සහ පුරවැසි මාධ්‍ය සම්බන්ධයෙන් අප රටේ තවමත් නිශ්චිත ආචාර ධර්ම පද්ධතියක් බිහි වි නැත. නමුත් විවිධ වෙබ් අඩවි හා සමාජ ජාලාවල නිර්මාපකයෝ විසින් තමන්ට ගැළපෙන ලෙස යම් යම් සීමාවන් සකස් කර ගෙන ඇත. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ සිදුවන සයිබර් අපරාධ වළක්වාලිම අරමුණු කොට ගනිමින් 2008 වසර වන විට නෛතික ප්‍රතිපාදන සකස් වන්නට විය. මෙම අභියෝග ජය ගැනිමට එනම් සයිබර් අපරාධ වළක්වා ගැනිමට නිති පැනවිමට පුරෝගාමි වු ආයතන කිහිපයකි. එනම්,

- පරිගණක අපරාධ අනුකම්ටුව, නිති කොමිසම සහ අධිකරණ අමාත්‍යාංශය.
- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය
- ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය
- **CNTEC** කමිටුව

පරිගණක අපරාධ සම්බන්ධයෙන් විග්‍රහ කර ඇත්තේ 2007 අංක 24 පරිගණක අපරාධ පනතේය. එහෙත් වෙනත් පනත් වල සඳහන් යම් වරදක් පරිගණකයක් උපයෝගි කර ගෙන සිදුකරන අවස්ථාවන්හි දී ඒවා ද පරිගණක අපරාධ ගණයට අයත් වේ. ශ්‍රී ලංකාව තුළ දි සයිබර් අපරාධ විමර්ශනයේ දි පහත සඳහන් පනත් වැදගත් වේ.

- 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත.
- 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රෝනික ගණුදෙනු පනත**(Electronic Transaction act – No 19 of 2000).**
- 2006 අංක 30 දරණ ගෙවීම් උපාය වංචා පනත**(Payment Device Frauds No: 30 of 2006).**


**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

- **2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත**

- **1983 අංක 22 දරණ අසභ්‍ය ප්‍රකාශන සංශෝධිත පනත.**

**මීට අමතරව සයිබර් අපරාධ සහ පරිගණක ආශ්‍රිත වංචා මර්ධනය කිරීම සඳහා වන ලෝකයේ ප්‍රධාන මෙහෙයුම් ආයතනය සහ ශ්‍රී ලංකාව අතර සහයෝගිතාව වර්ධනය කිරීමේ අරමුණින් කටයුතු සිදුකරමින් පවති. ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජ්‍යායතනය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා සර්ට් ආයතනය සහ අන්තර් ජාතික වශයෙන් ක්‍රියාතමක ( IMPACT) ආයතනය අතර එකගතාවයක් මේ සඳහා ඇති කර ගෙන ඇත.**

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA, University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**